




සිසිර දිසානායක

# අනේ සාධු

"Early Morning
As you wake up
Cock a do do do ! "

"ටක්ක ටඃ ටඃ ටඃ"

"කවුද අප්පච්චියේ මේ උදෑහැනැක්කෙම දෙරට තඩි බාන්නේ ?"

පින්සල ගැස්සිලා ඇහැරුණා. පන්හිඳ ගිහින් දෙර ඇරියා.

"පැන්සලයා....! !"
"තමුන්නැහැගේ වැඩේ හරි ගියාද ?" පින් ඇදෙන් බැහැලා එළියට ආවා.

"නැත්තං...... පී. ආර්. එකේ වැඩේ හරි ටික දෙහකට ලැගුම් පොලක් තමයි ඕන."
පැන් තමුන්ගේ ගමන් මළු ගේ ඇතුලට ගත්තා. පින් පන් දෙන්නාත් උදව් වුනා.

"මෙහාට ම කඩා පාත්වුණ එක හොඳ. කලියෙන් පොඩියක් දැණුං දීලා ආවානං තවත් හොඳ." දෙන්නා එක්ක යාලුවට රොටියක් පිච්චුවා. කට්ට සම්බෝල බෝතලයෙන් මේසෙ උඩට වැඩ මේවාව.

"සීතලට මරු !" පැන් මුණකට හෝදගොන ඇවිත් සප්පායං වුනේ විවේකයක් ගන්න හිතාගෙන.
"තමුන්නැහේ ඇලවෙලා ඉන්න. අද අපට රාජකාරි ගොඩාක් තියෙන දවසක්. මාරුවෙන් මාරුවට දෙර ඇරෙන වැහෙන සද්ද ආවට ගණන ගන්න ඕන නෑ."

උතුරු නෝර්බල් පාර්ක්වල කාර්වතා ද්විතීයික් පාසැලේ සෙනසුරාදට පවත්වන සිංහල ඉස්කෝලට යන්න පන් පිටත්වුණේ ඉහළ පන්තිවල දරුවන්ව අමතන්න ලැබුණ ආරාධනයකට. " සංස්කෘතය සහ මෙල්බර්න් නුවර සංක්‍රමණික අප" මාතෘකාවටයි යමක් කියන්න නියමිත වෙලා තිබුණේ. තුෂාර ප්‍රනාන්දු, චන්ද්‍රානී ප්‍රනාන්දු, ගුරු මහත්ම මහත්මීන්ගෙන් පන්ති දෙකත් එක්ක එකතු කරගෙන මේ සාකච්ඡාව සංවිධානය කලේ රෝහිණී ජයකොඩි ගුරු මාතාවයි.
"සිය සිසු සිසුවියන් දැනුවත් කිරි- මෙහිලා විවිධාකාර මං සොයමින් කැපව ක්‍රියා කරන සිංහල භාෂා පාසැල්වල මෙන්ම දහම් පාසැල් ගුරු භවතුන් වෙත අපහට ඇත්තේ විශාල ගෞරවයක්. එමෙන්ම එම ආයතනවල ඉගෙනුම ලබන කුඩා මෙන්ම තරුණ දරු දැරියන්ගේ උනන්දුව මෙන්ම පැවතුම් පිළිබඳව ද අප සිත්වල නැගෙනුයේ පහන් හැඟීමක්. සිය දරුවන් වෙනුවෙන්ම පුණ්‍යා පාදුක්කගේ ගුරුතුමිය ලියු "කැන්ගරු අම්මා" පොත් පිංච ද අගය කල යුතු වනනේ කුඩා සිත්වලට අගනා අදහසක් එක් කිරීමට ගන්නා ලද අහිංසක ප්‍රයත්නය නිසාවෙනි. පොත පුරාවට සිතුවම් ඇඳි මලීෂා උබයරත්න දැරියගේ සිතුවමකින් ම කංචුකය ද හැඩ වුයේ නම්........." පන් තමුන්ගේ හිතට ආව දේවල් ලිව්වා.

"එක ජන කොටසකට පමණක් සීමා නොවී සියල්ලන්ටම දැනුවත්විය යුතු දේ ඒ සියල්ල සඳහාම යොමු කිරීමට ඉදිරියේදී වාසනාව ලැබේවා ! ය යන්නයි අපගේ පැතුම.

හැන්දෑ යාමයේ පන්ටයි පින්ටයි අපේ අයගේ දේවල් දෙකකටම යන්න වුන හන්ද දෙන්නා දෙපැත්තට ගියා.

තරංග දන්දෙනිය තරුණ නිර්මාණකරුවාගේ දේශපාලන ජන ප්‍රහාසනය "රාසිං දෙයියෝ" නැරඹීමට හවස් වරුවේ ශාලාව පිරී ගොස් තිබිණ. දක්ෂ ශිල්පීන් රැසක් සමගින් කරලියට ආ ප්‍රහසනයේ විශේෂත්වය වුයේ රංගන ශිල්පීන්ගේ කුසලතායි. කුසුම්සිරි ලියනාරච්චි විපුල නයනානන්ද ශිල්පීන් ඒ අතරින් වඩාත් කැපී පෙනුණේ ඔවුන්ගේ ප්‍රධාන භූමිකාවන් නිසා විය හැකිය. රාසිං දෙයියෝ හැටියට රඟ පෑ ගාමිණී රණසිංහ ශිල්පීයට සිය හැකියාවන් දැක්වීමට තිර රචනයේ ඉඩක් නොලැබුණ සේය. කෙසේ වුවද ලැබුනා වු භූමිකාව සියුම් රංගනයේ කැටයම් කිරීමට සමත් වීය හේ. මංජිත චන්ද්‍රජිත් හා භානුක මනෝරත්න ගායනයෙන් ද දයක වෙමින් කවිකාර මඩුව රංගගත කලේ සිය සහජ හැකියාවන් දක්වමිනි. රත්නා ගුරුසිංහ, ගයනි මිමනගේ ඇතුළු අනෙක් පිරිසගේ දායකත්යයට කල එළිය දෙන ලද්දේ දසුන් ගජමන් ගේ ආලෝකරණයයි. ජන ගී රටා ඇසුරින් මෙන්ම නව නිර්මාණකරණයෙන් සජීව්ව නාට්‍ය සංගීතවත් වුයේ තරුපති මුණසිංහ තරුණ සංගීතවේදියාගේ ස්වර හා හඬ රටාවන් ගෙනි.



සීතාවක රජ සමය පසුබිම් කරගත් මෙම ප්‍රහසනය වේදිකා නාට්‍යයක් වශයෙන් හෝ ප්‍රහසනයක් වශයෙන් කොතරම් දුරට සාර්ථක වීද යන්න සිතීමට විචාරකයින්ට සහ ප්‍රේක්ෂකයින්ට භාර කරන්නෙමු."

"දෙරණ සුපර් ස්ටාර්" ප්‍රසංගය බලන්න ගියේ පින්. ප්‍රවීණ ශිල්පීන් වන නිරෝෂා විරාජිනි ගෙයි සහ අතුල අධිකාරිගෙයි ගායනා වගේම අලුත් තරුණ ගායක ගායිකාවන්ගේ ගීතත් මිහිරි වුනා. ඒත් කාගේත් හිත් වඩාත්ම ඇදිලා ගියේ "පුංචි අමරදේව" කියලා කියන හිමේෂ දිසානායක දරුවාගේ දක්ෂකම් වලටයි.

මීට කලින් සතියක "සුරම්‍ය රාත්‍රිය" ප්‍රසංගයේ ගීතවත් වුණ අමරසිරි පීරිස්, අමල් පෙරේරා දෙපොලගේ ගීතත් ඒ වගේම රසියකයින්ව ඇද බැඳ ගත්තා. නාලක අංජන තරුණ සංගීතවේදීයාගේ හපන්කම් අපේ අයට එද දැකගන්න ලබුණා.

පසුගිය සති අන්තය ගෙවුනේ මෙල්බර්න් නුවරට තවත් වැදගත් සිහිවටනයක් එකතු කරලයි. කිස්බරෝවල ධම්මසරණ විහාරස්ථානයේ අභිනව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයේ සිහිවටනයයි ඒ. විහාරාධිපති ගරු නාඹටුන්නේ විජිත ස්වාමින් වහන්සේගේ මුලිකත්වය ඇතිව දයක භාරකාරදී හැමෝම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු පටන් අරගෙන මුල්ගල තියපු ද ඉහළට ගත්ත හුස්ම ටික පහළට දැම්මේ ජුලි දහනව වැනි ඉරිද හවස දෙකට. පන්"පින්"පැන් තුන්දෙනාම ගියා උත්සවය බලන්න. ටිකක් වැස්ස හුගක් සීතල. ඒ වුනාට හුගක් සෙනග. ඒ හන්ද වැස්ස හීතල දැනුනේ නෑ.

විහාරස්ථාන භූමිය අතීතයේ නිජබිම කරගෙන ජීවත් වුණ කුලීන් :ණඹබෂහ* ජාතිකයින්වත් බුවර්වෘංග් :ඊධධහෑසෘඋසෘඹහඨ* ආදි වාසින්වත් සිහිපත් කරමින් කතාකල ශ්‍රී ලාංකික සම්භවයක් තියෙන ජුඩ් පෙරේරා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කතාවේ තිබුණ ගණන් ඉලක්කම්වලට පැන්ගේ හිත ගියා. කතාව ඉවර වුණ ගමන් පැන් මන්ත්‍රීවරයා බලාගෙන කියවපු කොලේ ඉල්ලා ගත්තා. පන් ඉංග්‍රීසියෙන් ලියවුණ දේවල් සිංහලට පෙරළුවා මේ විදියට.

"වර්ෂ 2006 සංගණන වාර්තාවන්ට අනුව ඒ වන විට වික්ටෝරියා ප්‍රාන්තයේ විසු බෞද්ධයින් ගණන 132,625 දෙනෙකි. එයින් 10,605 දෙනෙකුම ශ්‍රී ලංකාව මව්බිම කරගත්තෝ වුහ."

"වික්ටෝරියා ප්‍රාන්තය ලොව සියලුම ජන කොටස් නියෝජනය කිරීමට වාසනාවන්ත වී තිබේ. එහි ජනගහනයෙන් 23.8% ක්ම විදේශයහිදී උපත ලද්දෝ වෙති. 43.69% ක්ම විදේශකදී උපන් අය හෝ විදේශයක උපන් අයගේ දරුවෝ වෙති. රටවල් 200 කට වැඩි ප්‍රමාණයකින් සංක්‍රමණය වුවෝය. වික්ටෝරියානුවෝ ඔවුහු භාෂා 230 කට වැඩි ප්‍රමාණයක් කථා කරති. ආගම් 120 වැඩි ප්‍රමාණයක් අදහති.

කලින් දවසේ එංගලන්තයේ ඉඳන් මේ රටට ගොඩ බැස්ස පැන්සලට මේවා අදහගන්නත් බෑ වගේ.

දහම් පාසලේ දු දරුවන්ගේ කතා වලටයි ගායනා වලටයි කථා පන්ගේ හිත ගියේ. අභිනව ගොඩනැගිල්ල විවෘත කලාට පස්සේ හැමෝම තෙරපි තෙරපි ඇතුලට රිංගා ගත්තේ බලාගන්න තියෙන ආසාවට. අසෝක රාජපක්ෂ මහත්තයාගේ ගෘහ නිර්මාණ ශිල්පය පින්ගේ ඇස් දෙක එකපාරටම ඇදිලා ගියේ ඊට මොහොතකට කලින් නිරාවරණය කෙරුණ සුදෝ සුදු නව බුදු පිළිමයට.

"අනේ සාධු ! "පින්ට කියවුණා.
"දැන් ඉතින් මේවා රැක බලාගෙන පවත්වා ගෙන යන එක තමා අපි කාගේත් යුතුකම. ඒ වගේම වගකීම ! පන් කිව්වා.

"අනේ සාධු ! "පැන්ටත් කියවුණා.

**PRIME LAND FOR SALE**

Great investment Opportunity
Wont' Last long

**2.2Acre (2 acres 20 Perches) Land with a Bungalow**

Located in Mirigama, Kandangamuwa.
Facing Giriulla / Mirigama Main Road and Bordering Mirigama BOI (Export Processing) Zone.

15Min to Mirigama Town, 15 Min to Giriulla Town, 2Min to BOI Zone

Land with Coconut harvest / Pineapple cultivation (abandon),
Large Well used to supply water to BOI Zone
Income from Coconut harvest around Rs. 600 - 800 per month.
Water supply to BOI Zone average Rs.15000.00 - 20000.00 per month

1. Bungalow contains 3 Bedroom + Book room and attached Toilet/Bathroom, Kitchen, Dinning, Living area, with electricity, telephone, fans and tap water facilities and a car port.

1. Watcher / Servant quarters.

FOR MORE DETAILS :
**Contact : Duleep on 0422199326**

**කාන්තාවන් සඳහා නවාතැන් පහසුකම්**
Epping වික්ටෝරියා

පොදු ප්‍රවාහන පහසුකම් ඇති තැනක පිහිටි නව නිවසක කාන්තාවන් සඳහා නවාතැන් පහසුකම් ඇත

**විමසන්න**
**0430 841 838**

මෙල්බර්න් මහමෙව්නා අසපුව

"නිවන්නට බව ගිමන් -දෙසූ සදහම් නිවන්"

**ගෞතම බුදුරජුන්ගේ සාම සංදේශය පතුරවන්නට මෙල්බර්න් නගරයට අමාවැසි වසින වගයි**

නිකිණි පොහෝ දින වෙනුවෙන් පවත්වනු ලබන
ශීල භාවනා වැඩසටහන .........
අගෝස්තු මස 22 වන ඉරුදින
උදෑසන 6.00ට ආරම්භවන වගයි

**පිං කැමති ඔබටයි මේ ආරාධනා !**

*මෙම වැඩසටහන පවත්වනු ලබන ස්ථානය :*
නේබර්හුඩ් හවුස්, නො.36, මැකීපාර, මල්ග්‍රේව්
මෙල්වේ අංකය - 80B2

**මහමෙව්නාවෙන් ඇදහැලෙන අමාවැස්සෙන් ඔබටත් පැන් දෝතක් !**

මෙයට,
මෙත් සිතින්,
මහමෙව්නා උපස්ථාන කමිටුව

විස්තර සඳහා 88027394 අමතන්න